# මුදල් මණ්ඩලය
# ශ්‍රී ලංකා මහ බැංකුව

**2022 ජූලි 07** **චක්‍රලේඛය** **2022 අංක 02**

## පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා වන සහන

(මෙය 2022 ජූලි 07 දින නිකුත් කරන ලද 2022 අංක 02 දරන චක්‍රලේඛයේ සිංහල පරිවර්තනයකි.)

පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් විවිධ ආර්ථික අංශයන්හි නියැලී සිටින ව්‍යාපාර සහ පුද්ගලයන් මුහුණ දී ඇති අභියෝග සලකා බලමින් අවශ්‍යතා මත පදනම්ව බලපෑමට ලක්වූ ගනුදෙනුකරුවන්ට පහත සඳහන් සහන දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (බලපත්‍රලාභී බැංකු) වෙතින් ඉල්ලා සිටී.

මූල්‍ය පද්ධතිය මත ඉහළ පීඩනයන් ඇතිවීම වළක්වා ගනිමින් බැංකු අංශයේ ස්ථායීතාවය රැක ගන්නා අතරතුර ණය ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ නව හැකියාව මත පදනම්ව සුදුසු ආපසු ගෙවීමේ ක්‍රමවේදයන් සැලසුම් කිරීම සඳහා මෙම සහන ලබා දෙනු ලැබේ. ඒ අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු මඟින් ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන විචක්ෂණ අවශ්‍යතා සහිතව පුළුල් මාර්ගෝපදේශ ලබා දීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. බලපත්‍රලාභී බැංකු විසින් 2022 මාර්තු 24 දින නිකුත් කරන ලද 2022 අංක 01 චක්‍රලේඛය ප්‍රකාරව දැනටමත් ස්ථාපිත කර ඇති පශ්චාත් කොවිඩ්-19 පුනරුද ඒකක හරහා මෙම සහන ක්‍රියාත්මක කිරීමට සලකා බැලිය හැක.

### 1. සක්‍රීය ණය පහසුකම් සඳහා වන සහන

1.1 බලපත්‍රලාභී බැංකු විසින් දැනටමත් කොවිඩ්-19න් බලපෑමට ලක්ව සහන ලබන ණය ගනුදෙනුකරුවන්ද ඇතුළුව වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් අහිතකර ලෙස බලපෑමට පත් වූ පුද්ගලයන් හෝ ව්‍යාපාර වල (ණය ගනුදෙනුකරුවන්) සක්‍රීය ණය පහසුකම් සඳහා සුදුසු සහන (එනම්, මුල් ණය මුදල හෝ පොලිය සඳහා හෝ ඒ දෙකම සඳහා හෝ මුල් මුදලෙන් හෝ පොළියෙන් කොටසක් සඳහා සහන කාලසීමාවක් ලබා දීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම, හෝ වෙනත් යම් සහනයන්) සැපයීම අවශ්‍යවේ. සංචාරක සහ ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි නියැලී සිටින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඇතුළුව, නමුත් එම අංශවලට පමණක් සීමා නොවී, සියලුම ආර්ථික අංශයන්හි බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් හට ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ නව හැකියාව/ශක්‍යතාව මත පදනම්ව, මෙම චක්‍රලේඛය

නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා අවස්ථානුකූලව මෙම සහන ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1.2 සමාන වාරික ණය පහසුකම් සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු විසින් ණය ගනුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාවට ගැලපෙන පරිදි, පවතින ණය පහසුකම හෝ පහසුකම්වල ගිවිසුම්ගත වාරික වටිනාකම නොඉක්මවන ලෙස, දීර්ඝ කාල සීමාවක් සහිතව ආපසු ගෙවීමේ සැලැස්මක් සැකසීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතු වන අතර, වෙනත් ණය පහසුකම් සම්බන්ධයෙන්, ආපසු ගෙවීමේ සැලැස්ම සකස් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් සුදුසු යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

1.3 ණය සහන සඳහා සලකා බලනු ලබන රුපියල් ණය පහසුකම් සම්බන්ධයෙන්, සහන කාල සීමාව සඳහා (නැවත අය කරගැනීමේ කාල සීමාවද ඇතුළුව ) අදාළ වන පොලී අනුපාතිකය, නවතම ගිවිසුම්ගත පොලී අනුපාතිකය හෝ මෙම චක්‍රලේඛයේ දිනට ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම් අනුපාතය (එනම්, 15.5%), යන දෙකෙන් ඉහළ අගය වන අතර, එය ණය සහන සඳහා සලකා බලනු ලබන වටිනාකම මත පමණක් අය කළ යුතුවේ. විදේශ විනිමය ණය පහසුකම් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් සිය ගනුදෙනුකරුවන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ සහනදායී පොලී අනුපාතිකයක් අය කළ හැකිය.

## 2. ප්‍රතිමූල්‍යයන/ පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති ණය පහසුකම් සඳහා අදාළත්වය

2.1 රජය සහ වෙනත් ආයතන මඟින් හඳුන්වා දුන් විවිධ ප්‍රතිමූල්‍යකරණ හෝ පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති ණය පහසුකම් සඳහා මෙම සහන ලබා දීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් එම අදාළ ආයතන සහ රජයේ ආයතනයන්ගෙන් සුදුසු මාර්ගෝපදේශ ලබා ගත යුතුය.

## 3. ණය කලින් පියවීමේ පහසුකම් සැලසීම

3.1 කිසියම් ණය ගනුදෙනුකරුවෙකු දැනට පවතින ඕනෑම ණය පහසුකමක් සම්පූර්ණයෙන් පියවීමට කැමැත්තක් දක්වයි නම්, එවැනි ණය ගනුදෙනුකරුවන්ට පූර්ව ණය පියවීමේ ගාස්තු වැනි අමතර ගාස්තු කිසිවක් අය කිරීමකින් තොරව එම ණය පහසුකම පියවීම සඳහා

අවස්ථාව ලබා දිය හැකිය. එමෙන්ම කල්බදු පහසුකම් සම්බන්ධයෙන්, අනාගත පොලී අය කර ගැනීම ද කපා හැරිය යුතු වේ.

3.2 බලපත්‍රලාභී බැංකු විසින් අවස්ථානුකූලව එවැනි ණය කලින් පියවීම් සඳහා පොලී ප්‍රතිදාන ලබා දීම සම්බන්ධයෙන් සලකා බැලීමද සිදු කළ හැකිය.

3.3 තම ණය පහසුකම් කලින් පියවීමට කැමැත්ත ප්‍රකාශ කරන ඕනෑම ණය ගනුදෙනුකරුවෙකුට 2022.09.30 දින හෝ ඊට පෙර අදාළ බලපත්‍රලාභී බැංකුව වෙත සිය ඉල්ලීම් යොමු කළ හැකිය.

**4. අක්‍රීය ණය පහසුකම් සඳහා වන සහන**

4.1 බලපත්‍රලාභී බැංකු විසින් අදාළ පුද්ගලයන්ගේ සහ ව්‍යාපාර/ව්‍යාපෘති වල ණය ආපසු ගෙවීමේ නව හැකියාව/ශක්‍යතාව සලකා බලා, අවස්ථානුකූලව, දැනට පවතින අක්‍රීය ගණයේ ණය පහසුකම් දීර්ඝ කාලයකට ප්‍රතිලේඛන ගත කිරීම වැනි සුදුසු සහන ලබා දීමට සලකා බැලිය හැකිය.

4.2 බලපත්‍රලාභී බැංකු විසින් ණය පහසුකම් ආපසු ගෙවීම සඳහා වන සැලැස්ම සඳහා සුදුසු යාන්ත්‍රණයන් සැලසුම් කළ යුතුය.

4.3 රුපියල් ණය පහසුකම් සම්බන්ධයෙන් සහන ලබා දුන් අක්‍රීය ණය පහසුකම සඳහා අදාළ වන පොලී අනුපාතිකය, නවතම ගිවිසුම්ගත පොලී අනුපාතිකය හෝ මෙම චක්‍රලේඛයේ දිනට පවතින ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම් අනුපාතය (එනම්, 15.5%), යන දෙකෙන් ඉහළ අගය නොඉක්මවිය යුතුය. විදේශ මුදල් ණය පහසුකම් සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකුවලට සිය ණය ගනුදෙනුකරුවන් සමඟ එළඹි අන්‍යෝන්‍ය එකඟතාවයකට අනුව සහනදායී පොලී අනුපාතිකයක් අය කළ හැකිය.

4.4 බලපත්‍රලාභී බැංකු විසින් ණය ගනුදෙනුකරුවන්ට කාලීනව ණය ආපසු ගෙවීම සැලසුම් කිරීමට හැකිවන පරිදි, 2020.01.01 දින හෝ ඊට පසු අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති සියලුම ණය පහසුකම්වලට එරෙහිව නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග සහ කල්බදු

වත්කම් බලහත්කාරයෙන් නැවත පවරා ගැනීම ඇතුළුව නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග 2022.12.31 දින දක්වා අත්හිටුවිය යුතුය.

4.5 කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට එරෙහිව සිදු කරන නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග වලදී, දැනට පවතින ඔඩපණ ණය සම්පූර්ණයෙන් සහ/හෝ දැනට අක්‍රිය කාණ්ඩයේ පවතින ණය පහසුකම් පියවීම (කොටසක් හෝ සම්පූර්ණ ලෙස පියවීම ) සඳහා සුදුසු යාන්ත්‍රණයක් හරහා ඉදිරි අස්වැන්න නෙළන සමයේ විකුණුම් ආදායම සෘජුවම බැංකු වෙත යොමු කිරීමට ණය ගනුදෙනුකරුවන් සහ බලපත්‍රලාභී බැංකුව අතර එකඟතාවයකට එළඹීමට යටත්ව, ඕනෑම අක්‍රිය ණය පහසුකමකට එරෙහිව සිදු කරන නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග (පරාටේ බලගැන්වීමද ඇතුළත්ව), 2022.12.31 වන දින දක්වා අත්හිටුවිය යුතුය.

4.6 බලපත්‍රලාභී බැංකුවක් විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ හෝ 1949 අංක 06 දරන සංශෝධිත උකස් පනතේ හෝ 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතේ හෝ මේ සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම පනතක විධිවිධාන යටතේ නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ ඒ සඳහා දැනුම් දීමක් ලබා දී ඇති අවස්ථාවකදී, අදාළ බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරුවන් අතර ණය ආපසු ගෙවීමේ ගිවිසුමකට එළැඹීමේ කොන්දේසිය මත එවැනි ණය නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2022.12.31 දක්වා අත්හිටුවිය යුතුය.

4.7 බලපත්‍රලාභී බැංකු විසින් අදාළ බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරුවන් අතර ණය ආපසු ගෙවීමේ ගිවිසුමකට එළැඹීමේ කොන්දේසිය මත, එම ණය සහ අත්තිකාරම් නැවත අයකර ගැනීම සඳහා ඉහත පනත් යටතේ නව යෝජනා සම්මත කිරීම 2022.12.31 දින දක්වා කල්දැමිය යුතුය. තවද, ණය නැවත අය කරගැනීමේ ක්‍රියාමාර්ග සඳහා දැනටමත් යෝජනා සම්මත කර ඇති අවස්ථා වලදී, අදාළ වත්කම් වෙන්දේසි කිරීම 2022.12.31 දක්වා අත්හිටුවීම සිදු කළ යුතුය.

4.8 ණය අය කරගැනීම සම්බන්ධයෙන් අධිකරණයේ නඩු කටයුතු සිදුවෙමින් පවතින අවස්ථාවකදී මෙම සහන ලබා ගැනීම සඳහා ණය ගනුදෙනුකරුවන් අධිකරණය හමුවේ එකඟතාවයකට එළැඹිය යුතුය.

4.9 කෙසේ වෙතත්, හිතා මතා ණය ආපසු ගෙවීම පැහැර හැරීම, අරමුදල් වෙනත් අරමුණු සඳහා යොමු කිරීම හේතුවෙන් වන ණය ගෙවීම පැහැර හැරීම, ව්‍යාපාරයේ වැරදි කළමණාකරණය සහ/හෝ වංචාවන් නිසා සිදුවන ණය පැහැර හැරීම සහ ශක්‍යතාවයකින් තොර ව්‍යාපෘති හේතුවෙන් වන පැහැර හැරීම යන කරුණු සම්බන්ධයෙන් වන ගනුදෙනුකරුවන් ඉහත සඳහන් කිසිදු සහනයක් සඳහා සලකා නොබැලිය යුතුය.

4.10 බලපත්‍රලාභී බැංකු හට සිය ණය ගනුදෙනුකරුවන්ට අධික ලෙස ඇමතුම් ලබා දීම /හමුවීමට යාම, බල කිරීම ආදියෙන් තොරව, තම සුපුරුදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග මඟින් ණය අය කරගැනීම, පසු විපරම් කිරීම ආදිය සඳහා හැකියාව ඇත.

**5. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම**

5.1 බලපත්‍රලාභී බැංකු විසින් අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තා මත පමණක් පදනම්ව ණය ගනුදෙනුකරුවන්ගේ නව ණය අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සිදු නොකළ යුතුය.

5.2 අවශ්‍ය වන්නේ නම්, ණය තොරතුරු කාර්යාංශයේ උපදේශනයන්ද සහිතව බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දී ඇති සහනයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ ක්‍රමවේදයක් බලපත්‍රලාභී බැංකු විසින් සකස් කළ යුතුය.

**6. ගිණුම්කරණ කටයුතු හා ණය හානිකරණ සඳහා වෙන් කිරීම**

6.1 බලපත්‍රලාභී බැංකු විසින් සහන සඳහා සලකා බලනු ලබන ණය පහසුකම් හා සම්බන්ධිත ගිණුම්කරණ කටයුතු වලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ මේ සමඟ අමුණා ඇති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අතිරේකය තුළ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය.

6.2 මේ සම්බන්ධව අමතර මඟ පෙන්වීම්/පැහැදිලි කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවලට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් උපදෙස් පැතිය හැක.

**7. ලබා දුන් ණය සහන සම්බන්ධ විනිවිදභාවය**

7.1 සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් විසින් ඉහත සඳහන් ණය සහන සඳහා 2022 ජූලි 31 දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් ඉල්ලුම් කළ හැකිය.

7.2 එකී ඉල්ලීම් සම්බන්ධයෙන්, එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ බලපත්‍රලාභී බැංකුවේ තීරණය, ඉල්ලීම ලැබුණු දින සිට මාසයක් ඇතුළත අයදුම්කරුවන් වෙත නිසි පරිදි දැනුම් දිය යුතුය.

7.3 ඉහත ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන අවස්ථාවකදී, එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු බලපත්‍රලාභී බැංකුව විසින් අයදුම්කරු වෙත දැනුම් දිය යුතු අතර, අයදුම්කරුට තම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙන බව ද එම ලිපිය මඟින්ම දන්වා සිටිය යුතුය.

7.4 ණය පහසුකම් කල් තැබීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධිත ක්‍රමවේදය සහ අදාළ පොලී අනුපාත සම්බන්ධයෙන් අදාළ පහසුකම අනුමත කිරීමට පෙර දැනුවත් කළ බවට බලපත්‍රලාභී බැංකු විසින් සහතික විය යුතු අතර ඒ සඳහා ගනුදෙනුකරුගේ කැමැත්ත ලිඛිතව හෝ විද්‍යුත් ආකාරයෙන් ලබා ගත යුතුය.

**8. වාර්තාකරණ අවශ්‍යතාව**

බලපත්‍රලාභී බැංකු විසින් ණය ගනුදෙනුකරුවන් විසින් ලබාගත් සහන පිළිබඳ තොරතුරු 2022 ජූලි 31 දින සිට ආරම්භ වන පරිදි, සෑම මාසයකම අවසානයට පවතින තත්වය එදින සිට දින 15ක් ඇතුළත, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු අතර, අදාළ වාර්තාකරණ ආකෘති බලපත්‍රලාභී බැංකු වෙත ඉදිරි කාලයේදී යොමු කරනු ඇත.

අත්සන් කළේ

**ආචාර්ය පී නන්දලාල් වීරසිංහ**
*මුදල් මණ්ඩලයේ සභාපති සහ*
*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*